AUGUST 2021
ISSUE NO. 13

# අපි

MONTHLY
GROUP DIGEST




us.lk

OFFICIAL GOLD SPONSOR FOR 1333 BIKEATHON

CCCline 1333 WE LISTEN SUPPORT EMPOWER

LetsTALK Letting everyone talk safely.



*Picture by S J Wodson CLG*

# IN THIS ISSUE

**05** **CHAIRPERSON'S VISIT**

Unilever Chairperson Hajja Alfifi makes vist to CLG

**09** **1333 BIKEATHON**

2021 වර්ෂයේ පැවැත්වෙන 1333 Bikeathon සයිකල් සවාරිය පිළිබද විස්තර

**12** **FRIENDSHIP DAY**

**15** **CHALLENGES DUE TO COVID**

"Covid-19 " has become a contemporary challenge to Sri Lanka now. READ MORE...

**18** **AIRTEL 100 DAY PROGRAM**

Airtel දින 100 වැඩමුළුවෙන් බිදක්...

**20** **SPECIAL OFFERS**

ඔබගේ නිවසට අවශ්‍ය භාණ්ඩ විශේෂ මිලකට අපෙන්!

# EDITORIAL

Amila Gunawardana

Hello Everyone,

My message this month is not on Covid, the organization outlook, professional aspect or any other but on life itself. I feel sometimes we forget who we really are and some of the most important things in life. So here is a reminder…

From the day we are born we look for **LOVE**. Cos it is love that commemorates our soul. And when we are lucky enough to find it in our lives, we are changed forever!

Love comes in different forms. When you are born you are first loved by your parents, then siblings, families' friends, and subsequently, maybe a lifelong soul mate. They say where there is Love there is Life.

**Happiness** on the other hand is a state of mind. Sometimes bad things happen in our lives that put us directly on the path to the best things that will ever happen to us. Time decides who we meet in our lives, your heart decides who you want in your life, and your behavior decides who stays in your life.

**Trust** on the other hand is also an important factor. It is not only important in our personal lives but in our corporate world. A very famous man once said 'Sincerity is Everything'. It is trust among our peers, colleagues supervisors and line managers that will derive a good corporate culture.

Like Lord Buddha reminded us, LOVE All, Trust few, Everything is Real but not Everyone is True.

***"If they lie to you, that means they don't RESPECT you, If, they don't RESPECT you, then they don't LOVE YOU."***
***-Julius Caesar***



# FOUNDER'S NOTE

Manjula Kulatunga

කොවිඩ්-19 දිගටම අපගේ දෛනික ජීවිතයේ කොටසක් වෙමින් පවතින අතර අපි ආරක්ශක පියවර ගනිමින් බොහෝ විට හුදකලාව වැඩ කිරීමට පුරුදු වී ඇත. මෙහිදී ඉතාම වැදගත් වන කාරණයක් අප අමතක නොකළ යුතුය. එනම්, සමාජය තැනී ඇත්තේ අප වටා ඇති පුද්ගලයින්, ආයතන / සමාගම්, විවිධ මත හා පිළිගැනීම්, සහ සංස්කෘතික අදහස් වලින්ය.

සහයෝගිමත් කණ්ඩායමක් බිහි කිරීමට අප සැම දෙනාගේම උනන්දුව සහ කැපවීම අවශ්‍ය වේ. අපගෙ ධෛර්යය, රැකියාවට තිබෙන ආශාව, කැපවීම සහ පක්ෂපාතීත්වය කණ්ඩායමට ධනාත්මක වෙනසක් ගෙනෙනවා නොඅනුමානය. ඒවගේම කණ්ඩායම් සාමාජිකයන්ට ගරු කිරීමද ඉතාම වැදගත් කාරණයක් වේ. සාර්ථක, සහයෝගිමත් කණ්ඩායමකට ශ්‍රේෂ්ඨ ආයතනික සංස්කෘතියක් ඇති කිරීමට හැකියාව ඇත. එය විශිශ්ඨ සමාජයක් බිහි කිරීමට උපකාරී වේ. එබැවින්, අපි තනිව හෝ හුද්කලාව වැඩ කලද, අපි විශාල සමාජ පද්ධතියක කුඩා කොටසක් පමණක් බව මතක තබාගත යුතුය.



us.lk

TOKYO 2020

# ALL THE BEST SRI LANKA!



# CHAIRPERSON'S VISIT TO CLG

## Unilever Chairperson Hajja Alfifi visits Ceilao!

සෙයිලාඕ ආයතනය යනු යුනිලීවර් ආයනය හා එක්වෙමින් පසුගිය අසීරු කාලයේදී නොනවත්වා ජනතාවට විශිෂ්ටතම මෙහෙවරක් කළ එකම යුනිලීවර් නියෝජිතයා විය. අවුරුදු තුනක් වැනි කාලය තුළ පළමු වරට පසුගිය 16 වනදා (2021 ජූලි 16 )අපගේ සේවාව දැක ගැනීමේ අරමුණින් යුනිලීවර් ආයනයේ සභාපතිනිය පැමිණියාය. නමින් හජා අල්ෆිෆී වන ඇය මොරොක්කෝ ජාතික බ්‍රිතාන්‍ය පුරවැසියෙක් වීම විශේෂ කරුණකි.

එදින ප.ව 1.00 ට ආරම්භ කල වෙළද සංචාරයේදී සෙයිලාඕ ආයතනයේ කාර්ය සාදනය සහ වෙළද ප්‍රගතිය පිලිබද පැසසුමට ලක් කරන ලදි. සෑම වෙළඳසැලකම 95% යුනිලීවර් නිෂ්පාදන පවත්වාගෙන යෑම, 100% එය ප්‍රදර්ශන කර තිබීම, ගම්බද වෙළඳසැල් පවා එම තත්වයෙන් පවත්වාගෙන යෑම එයට පිටිවහලක්වූ කරුණකි.

එමෙන්ම අප සේවාව ලබාදෙන වෙළඳසැල් ඊළඟ තලයට ගොඩනැගීමට අප සමග සිටින යුනිලීවර් නියෝජිතයන් වන දීපාල් මහතා සහ දිනේශ් මහතා විසින් සකස් කරන ලද සැලසුම් ඇයට ලබාදුන්නේ මහත් ආඩම්බරයකි. එම සංචාරය තවත් රසවත් වුණේ සතුටුදායක තත්වයේ පවතින අප සේවාව සමගම එතුමියගේ ජීවිතයේ පළමුවරට දුටු දසුන් කීපයක්ද සමගයි.

තම ආයනයේ ව්‍යාපාර හවුල්කරුවන් විදේශගතව සිට මෙහෙයවීම දුර්ලභ අවස්ථාවක් වුණත් එම ව්‍යාපාරයේ යුනිලීවර් ආයනයේ සභාපති සංචාරයකදී ඔවුන් සමග තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වීම එතුමියට ශ්‍රී ලංකාව තුල පළමු අවස්ථාව විය.

සමස්තයක් ලෙස මෙම සංචාරය ඉතා සතුටුදායක තත්වයේ පවතින බව එතුමියගේ මුවින් අසන්න ලැබීම අප හට ඉතා සතුටුදායක කරුණකි.

එය සදහා අපට ශක්තිය වූ අපගේ භාන්ඩ ප්‍රදර්ශන නියෝජිතන්, වෙළඳ නියෝජිතයන්, බෙදාහැරීම් කන්ඩායම කළ මහගු සේවය අගය කරන්නෙමු. එමෙන්ම අපගේ ගබඩා සේවකයින්, කාර්යාල සේවකයින් ඇතුළු සියලු දෙනා අපගේ ශක්තිය කොට සළකන්නෙමු.



තවද යුනිලීවර් ආයතනයේ DT අංශ ප්‍රධානී - චන්දික දයාරත්න මහතා බස්නාහිර පළාත් කළමනාකරු - දීපාල් වික්‍රමසිංහ මහතා ප්‍රාදේශීය කළමනාකරු - සුපුන් කොස්ගොල්ල මහතා කලාප කළමනාකරු - දිනේශ් කරුණාතිලක මහතා කලාප වෙළඳ විධායක - ඉදුනිල් මනුරංග මහතා ඇතුළු කන්ඩායම සෑම විටම අප හට ලබාදෙන සහයෝගට හදවතින්ම ස්තුතිය පුදකරන්නෙමු.

සටහන: CLG ආයතනය වෙනුවෙන්
S Jවොඩ්සන්










JULY SPECIAL
Happy Birthday Manjula!
FROM ALL OF US @US.LK

# SAY NO TO SUICIDE, SAY YES TO LIFE.

YOU MAY NOT THINK IT,
BUT YOU HAVE SO MUCH TO LIVE FOR.

CCC line
1333
WE LISTEN SUPPORT EMPOWER

Let's TALK
Letting everyone talk safely.


# 1333 BIKEATHON/ සයිකල් සවාරිය

2021 වර්ෂයේ පැවැත්වෙන 1333 Bikeathon සයිකල් සවාරිය සඳහා පෙරමුණට පැමිණි ඔබට ස්තුතිවන්ත වෙමි. මෙම වර්ෂයේ කණ්ඩායමට ඔබ සහ ඔබගේ සංවිධානය සම්බන්ධ වීම මහත් සේ අගය කරමි. ඔබගේ ත්‍යාගශීලිත්වය, 1333 දිරිමත් කිරීමේ මහඟු සම්පතක් වන්නේය .

ඔබ දන්නා පරිදි, 1333 බයිකතන් හි අරමුණ වන්නේ 1333 අර්බුද නිරාකරණ සේවාව පිළිබඳ දැනුවත් කිරීම සහ එම සේවාව සඳහා අරමුදල් එකතු කර ගැනීමයි .

ශ්‍රී ලංකාවේ මිළියන 1.8 ක් වූ ජනගහනය තුළ වාර්තා වන අන්දමට එක් දිනක් තුළ සිය දිවි නසා ගැනීම් 10 - 12 සිදු වන අතර සියදිවි නසා ගැනීමට උත්සාහ ගැනීම් 100 පමණ සිදුවේ. එසේම 2020 දී සියදිවි හානි කරගැනීමේ අනුපාතිකය 14.7/100000 ක් බවට වාර්තා වී ඇත. 1987 දී 57/100000 ක් වූ සියදිවි හානි කරගැනීම් අනුපාතිකය, 2020 වන විට 14.7 දක්වා පහතට බැස ඇතත්, සියදිවි හානි කර ගැනීමට තැත් කිරීම් තවමත් ඉහළ මට්ටමක පවතී.

මේ නිසාම ශ්‍රී ලංකාවේ 1333 වැනි සේවාවන්හි අවශ්‍යතාව ඉහළ මට්ටමක පවතී. 1333, දිනපතා පැය 24 පුරා නොමිළයේ භාෂා 3න් ම පැවැත්වෙන අර්බුද නිරාකරණ සේවාවක් වන අතර ඕනෑම අයෙකුට ශ්‍රී ලංකාවේ ඕනෑම තැනක සිට පුහුණු අර්බුද නිරාකරණ නිළධාරියෙකුට විශ්වාසයෙන් යුතුව ඇමතිය හැකිය.



කොවිඩ් ලෝක වසංගත කාලය තුළ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ,වැඩිහිටි හා ළමා අපයෝජනය ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. රට වසා තිබූ සහ සංචාරක සීමාවන් පනවා තිබූ කාල සීමාවන්හිදී, 1333 මහත් දුෂ්කරතා මැද අපගේ දුරකතන අර්බුද නිරාකරණ සේවාව සේවා ඇවැසි ජනතාවට ලබා දී ඇත. 2019 දී ප වා,1333 බයිකතන් සවාරිය පවත්වන ලදී.

අප විශ්වාස කරන පරිදි මේ වසරේ එය ශ්‍රේෂ්ඨ එකක් වනු ඇත. බයිකතන් සවාරියට පෙර සහ එය පැවැත්වෙන අතරතුරදී ,1333 ට සහාය විය හැකි ආකාරයන් පිළිබඳ ඔබ දැනුවත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.



1333 සංවිධානය වෙනුවෙන්
රනිල් තිලකරත්න




# 1333 BIKEATHON

*out of the shadows*

# OUT OF THE SHADOWS

## CYCLING TOUR

8TH CONSECUTIVE YEAR

Raising awareness for the 1333 toll free and Confidential Crisis Support service by CCCline. You can call: 1333 from any phone network 24x7.


dreams don't work unless you do
John C. Maxwell

# මිත්‍රත්වයේ දිනය සහ ඔබගේ මිතුරන්.....

මිත්‍රත්වයේ දිනයක් සඳහා මුල් අදහස පැමිණියේ 1930 ගණන් වල හෝල්මාර්ක් නම් කාඩ්පත් සමාගම මඟිනි. 1958 දී පැරගුවේ වැසියන් පිරිසක් ජාත්‍යන්තර මිත්‍රත්ව දිනයක් යෝජනා කළහ.කෙසේ වෙතත් මිත්‍රත්වයට ගෞරව දැක්වීමේ දිනයක් පිළිබඳ අදහස ආසියාවේ රටවල් ගණනාවක් විසින් සම්මත කරන ලද අතර තවත් වසර ගණනාවකට පසු 2011 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ජූලි 30 ජාත්‍යන්තර මිත්‍රත්ව දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

ලොව පුරා සමාජ මාධ්‍යවල ජනප්‍රියතාවය වැඩි වීමත් සමඟ ජාත්‍යන්තර මිත්‍රත්ව දිනය අන්තර්ජාලය හරහා සැමරීම ඉහළ ගොස් තිබේ. නම පෙනෙන ආකාරයටම මිත්‍රත්ව දිනය යනු අපගේ මිතුරන්ට ගෞරව කිරීමට හා සැමරීමට දිනයකි.

මිතුරන් නොමැතිව හෝ වැඩ සගයෙකු නොමැතිව වැඩ කරන ජීවිතයක් ගැන සිතන්න. එය දැනෙන්නේ කෙසේද? බොහෝ දුරට එහි හිස් බවක් දැනෙනු ඇත. නේද? ඔබට මිතුරන් අවශ්‍ය වන්නේ එබැවිනි. එනමුදු හොඳ මිතුරන් තෝරා ගැනීම ඔබගේ වගකීමයි. හොඳ මිතුරන් මගින් ඔබට  සතුටක්  සහයෝගයක් ලැබිය හැකි වනවා මෙන්ම නරක මිතුරන් ළං කර ගැනීමෙන් ඔබගේ ජීවිතය විනාශය කරා ඇදී යා හැකිය.

දවසින් වැඩි කාලයක් අප ගෙවන්නේ අපගේ දෙවන නිවහන වන රැකියා ස්ථානයේය. එනිසා එහි අපට යහපත් මිතුරන් සිටීමෙන් විනෝදයෙන් ආකර්ශනීය ලෙස සහ තෘප්තියකින් වැඩ කිරීමට හැකි වේ. එනිසා සෑම විටම යහපත් මිතුරන් ළං කර ගැනීමට උත්සහ කරන්න. හොඳ මිතුරන් අපගේ ජීවිතයේ ප්‍රීතියෙන් කොටසක් විය හැක.

ඔබ සගයන් සමඟ ඇති කර ගත් මිත්‍රත්වය තව තවත් ශක්තිමත් කර ගන්න. හොඳ මිතුරන් කිසි දිනක ඔබගේ කරදරයකදී ඔබව හැර නොයනු ඇත. ඔබගේ පවුලේ කෙනෙකු මෙන්ම ඔබට උදව් කරනු ඇත. එලෙසින්ම ඔබට පැවරී ඇති කාර්යයන් වඩාත් නිවැරදිව හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට ඔවුන්ගේ සහයෝගයත් නොඅඩුව ලැබෙනු නොඅනුමානයි.



දිනේශිකා ලක්මාලි

CLG කොච්චිකඩේ










CEILAO LOGISTICS GROUP (PRIVATE) LIMITED.

DISTRIBUTOR TRADE

Unilever

# Target Achievers

JUNE

Astra
























C.L.G SERVICES (PRIVATE) LIMITED.

# JUNE

airtel













C.L.G SERVICES (PRIVATE) LIMITED.

Fonterra

# JULY

# CONTEMPORARY CHALLENGES FACED BY THE PEOPLE DUE TO THE COVID-19 IN SRI LANKA

"Covid-19 " has become a contemporary challenge to Sri Lanka now. Every sector is undergoing great changes during this pandemic period. This virus has loaded many changes in the world. Not only has it given up countless lives, it has also diverted people's livelihoods.
At a time when Sri Lanka is going through many challenges, the virus has turned into three waves and has taken a heavy toll on the country's economy. One of the most significant public health measures implemented during the COVID-19 pandemic has been extended periods of 'lockdown' where whole populations have been advised to remain in their households other than to collect necessary supplies, to care for others, or to exercise.

However, the impact of the pandemic and its consequences are perceived differently depending on our status as individuals and members of the community. Some try to adapt to working online, homeschooling their children and ordering food via online, while others have no choice but to be infected with the virus while keeping the community functioning. This sudden pandemic has affected the people who work for daily wages and who considered as low-income people. For few months, people were forced to stay at home, So the rural areas are vulnerable economically. Those areas tend to have higher poverty rates, lower rates of insurance coverage, and residents are more likely to work in the service industry or tourism, making them more burdened during these times.

...Cntd

## ...Cntd

And companies, Business entities and other organizations now face a range of unique challenges related to the pandemic that will require dedicated, effective solutions if they want to remain competitive during this time. In a sector like manufacturing, factors like price and on-time delivery are critical to business success. On-time delivery has been particularly important during the COVID-19 pandemic, as retailers have had to respond to sudden increases and fluctuations in demand from consumers. However, COVID-19 has created a 'new normal' that the fact of the matter is businesses the world over is navigating uncharted territory and looking for ways to find their footing in a situation they've never experienced before.

Moreover, the way students go to school and improve their education has changed and for the past one year they have been learning their education in online. Therefore, the physical education system has changed as Virtual education system. And this sudden change has called into question the study of many students in Sri Lanka. Not has Smart phones, Laptops, computers, Tablets and internet facilities to study in this education system.

And this unavoidable situation beyond the ordinary experience leaded to the depression, anxiety and a feeling of helplessness among people. Further the confusions as to what their life was and what to do next caused stress among people. And sexual violence is also increased, women and children suffered a lot during these days. So far, the country is trying to determine the end of a story while the plot is still twisting is difficult. But people are slowly adapting to this new normal life.

STOP
DREAMING

and

*Start Doing.*

# Airtel දින 100 වැඩමුළුවෙන් බිඳක්....

**"අපි දැන් 4G"**
**"අපේ නම් No Buffering"**
**ඇත්තටම අපි දැන් අලුත් වෙලා...වෙනස් වෙලා... දියුණු වෙලා... හැබැයි ගොඩක් අය දන්නෙ නැහැ... ඒ නිසයි අපි තීරණය කලේ අලුත් විදිහට වෙනස් විදිහට හරි විදිහට ඕගොල්ලනගෙ සමීපතයෙක් වෙන්න අලුතෙන්ම එන්න... අපි මේ ගැන අහලම දැන ගමු... ඒකට මම කිරිබත්ගොඩ ප්‍රාදේශීය කළමනාකරු - තුසිත සෙනෙවිරත්න මහතා හමුවුනා...**







ඇත්තටම මොකක්ද මේ දින 100?
ඇත්තටම මෙතනදි අපි බලාපොරොත්තු වෙන්නෙ අපේ සියලු පාරිභෝගිකන්ට අපේ 4G සම්බන්ධතාවය හදුන්වාදීමට සහ airtel 4G පිළිබදව පුලුල් දැනුවත්කිරීමක් සිදු කිරීමටයි...

මේ දින 100දි ඔබ තුලින් දැනටමත් සිදුවන සහ සිදුවීමට නියමිත වැඩසටහන් වැඩමුලු ගැන කතා කරොත්...
පලවෙනිම දේ අපි සියලුම පාරිභෝගිකයන්ට දැනටමත් 4G සිම්පත් නොමිලේ ලබා දෙනවා, අපේ වෙළදමහතුන්ටත් අපි විශේෂ කොමිස් මුදලක් සහ විශේෂ වරප්‍රසාදයන් ලබාදෙනවා.

දෙවෙනි එක තමයි අපේ සියලුම අලෙවි විධායක මහතුන් සහ අපේ ව්‍යාපාර සංවර්ධන විධායක මහතුන් දිනපතා 3G සිම්පත් 4G කිරීමට පාරිභෝගිකයන්ගේ නිවසටම ගොස් සේවය ලබා දෙන අතර සෑම නගරයකම නොමිලේ 4G සිම්පත් ලබාදීම සිදුකරනවා.

වැදගත්ම කාරණාව මේ දින 100 තුළ අපි නව නිෂ්පාදන හදුන්වාදීමක් කරනවා සහ ඒ සියලුම නිශ්පාදන පැකේජ ලෙස අපේ සියලුම පාරිභෝගිකයන්ට වාසිදායී ලෙස ලබා දෙනවා....

අනිත් එක තමයි සියලුම වෙළඳසල් වල මේ වන විටත් පහසුවෙන්ම පාරිභෝගිකයන් දැනුවත්වීමට පෝස්ටර්ස්, ස්ටිකර්ස්, 4G ඇත සදහන් බෝර්ඩ් ද ඔවුන්ට සපයා දී අප විසින්ම ප්‍රදර්ශන කටයුතුද කරදී තිබෙනවා.

ඉදිරි මාසයේ සිට සියලුම TV චැනල් හරහා රේඩියෝ චැනල් හරහා පැයෙන් පැයට අපේ මේ 4G ජාලය සම්බන්ධයෙන් දැනුවත්කිරීමක්ද දකින්නට අහන්නට ලැබේවි...

අපි දැන් මේ මොහොත..අද දවස 101 වන දිනය කියලා හිතුවොත්??? මේ වෙද්දි Airtel කොහොමවෙයිද?
ඒ වෙද්දි විශාල වෙනසක් වෙලා තියෙයි, මොකද අපේ මේ වැඩසටහනෙන් පස්සෙ අපි බලාපොරොත්තු වන කරුණු 3ක් තියෙනවා..ඒ තමයි සියලුම පාරිභෝගිකයන් මේ ගැන දැනුවත්වෙලා ඉන්න ඕනෙ, ඔවුන් මේ වෙනස දකින්න ඕන සහ වෙනස අත්හදාබලන්න කිසිම අපහසුතාවයකින් තොරව මේ සේවාව ලබාගන්න පුලුවන් වෙන්න ඕන......මේ සියල්ලෙන්ම පසුව අපි විශාල වර්ධනයක් බලාපොරොත්තු වෙනවා....හරියටම කිව්වොත් 3 ගුණයක වර්ධනයක්......

සටහන: කෞශල්‍යා රාජපක්ශ
















# AIRTEL DREAM TEAM...

airtel
















# SPECIAL OFFERS!

## ඔබගේ නිවසට අවශ්‍ය භාණ්ඩ විශේෂ මිලකට අපෙන්!

*මිල ගණන් ඔබේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ පළ කර ඇත.

# OUR TEAM



Annya Gunasekara
Designer & Content Writer



Salvius Wodson
Ceilao Logistics Group



Achala Abayawickrama
Civicon Engineering



Deirdre Mendis
Australian Migration Consultants



Kasun Jayasinghe
Thomas Peer Solutions



Surangi Fernando
Ceilao Logistics Group



Dineshika Lakmali
Ceilao Logistics Group



Suni Bastians
Australian Strategic Partnerships



Maheka Rabel
Australian Talent Network




Kaushalya Rajapakse
Airtel Operations



Supun Dewapriya
Ceilao Logistics Group



Shalani Sandaruwani
CLG Services



Danuka Savinda
Thomas Peer Sri Lanka



Janaka Chathuranga
CLG Services



Sanju Priyankara
CLG Services



Ceilao Logistics Group
www.clg.lk

Australian Migration Consultants
www.amconline.com.au

Civicon Engineering Services
www.civiconeng.com

Australian Talent Network
www.austalentnetwork.com

Thomas Peer Solutions
www.thomaspeer.com.au




Ceilao Ezy
www.ceilaoezy.com

Australian Strategic Partnerships
www.sp-solutions.biz

Go Ceilao
www.goceilao.com

Ceilao Spill Absorbent
www.ceilaospillabsorbent.com

Ceilao E-Sports
www.ceilaoesports.com

School of PTE
www.schoolofpte.com